2021 ජූනි 14 දින

**මාධ්‍ය නිවේදනයයි**

**ඉන්ධන මිළ වැඩි කිරීමේ තීරණයේ වගකීම බලශක්ති ඇමතිගේ කර මත පැටවීමේ වෑයම හෙලා දැකීම**

වර්තමානයේ දී ලොව සෙසු රටවල් සේම අප රට ද මුහුණ පා ඇති කෝවිඩ් වසංගත තත්වය හමුවේ පොදුවේ මහජනතාව තම ආදායම් මාර්ග අහිමි වූ හෝ අවම වූ ඉරණමකට ඇද වැටී සිටිති. එමෙන්ම රජයේ ආදායම් මාර්ග ද බොහෝ සේ බිඳ වැටී තිබේ. ජනතාව සහ ආණ්ඩුව යන අංශ දෙකම එබඳු අභියෝගාත්මක් ඉරණමකට මුහුණ පා සිටින මෙබඳු අවස්ථාවක දී ඇතැම් "ජනප්‍රිය නොවන" තීරණ ගැනීමට කවර ආණ්ඩුවකට වුවද සිදුවිය හැක. මේ අවස්ථාවේ දී තෙල් මිළ වැඩි කිරීමේ තීරණය ද එවැනි "ජනප්‍රිය නොවන" තීරණයක් බව අපගේ නිගමනයයි. එබඳු තීරණයකින් පීඩාවට පත්වන අඩු ආදායම්ලාභින්ට සහන සැපයීම අත්‍යාවශ්‍ය යැයි ද අපි අවධාරණය කරමු. ඒ සඳහා සුදුසු ක්‍රමවේද ඇතුලත් යෝජනාවලියක් අතිගරු ජනාධිපතිතුමා වෙත ඉදිරියේ දී ලබා දීමට අපි බලාපොරොත්තු වෙමු.

මෙම ඉන්ධන මිළ ඉහළ නැංවීමේ "ජනප්‍රිය නොවන" තීරණයේ වගකීම බලශක්ති අමාත්‍යවරයාගේ කර මත පැටවීමට දරණ වෑයම අපි ප්‍රතික්ෂේප කරමු. ඊට හේතු වන්නේ ඉන්ධන මිළ ඉහළ නැංවීමේ තීරණය අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් සහ ගරු අග්‍රාමාත්‍යතුමාගේ සහභාගිත්වයෙන් රැස්වුණු ජීවන වියදම පිළිබඳ අමාත්‍ය මණ්ඩල අනුකමිටුව විසින් ගනු ලැබූ තීරණයක් වීමයි. පසුගිය දා ජනාධිපති මාධ්‍ය අංශය විසින් ද මේ බව තහවුරු කර තිබුණි. එවැනි පසුබිමක ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ ප්‍රධාන ලේකම් පත් කළ මන්ත්‍රී සාගර කාරියවසම් මහතා "ජනප්‍රිය නොවන" තීරණයේ වගකීම උදය ගම්මන්පිල ඇමතිතුමා මත පටවා එමගින් ආණ්ඩුව ජනතාව ඉදිරියේ අනවශ්‍ය අර්බුදයකට ඇද දමා තිබේ. එමෙන්ම ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ ප්‍රධාන ලේකම් විසින් ජනාධිපතිතුමා සහ අගමැතිතුමා ගත් තීරණය අභියෝගයට ලක් කිරීමෙන් ආණ්ඩුව තුල කල්ලිවාදයක් ඇතැයි යන කුකුස ජනතාව ඉදිරියේ තබා ඇත.

මෙවැනි කට්ටිවාදී සහ අපරිනත ක්‍රියාවන් විසින් අවසානයේ දී ආණ්ඩුව පිළිබඳ මහජන විශ්වාසය බිඳ වැටීමට හේතුවන බව ද පෙන්වා දීමට කැමැත්තෙමු. එබැවින් මෙම කට්ටිවාදී ප්‍රවණතාව වහාම පරාජය කිරීම අතිගරු ජනාධිපතිතුමන්ගේ සහ ගරු අග්‍රාමාත්‍යතුමන්ගේ වගකීම බව ද අවධාරණය කරමු.

| | |
|---|---|
| අතුරලියේ රතන හිමි | අපේ ජනබල පක්ෂය |
| විමල් වීරවංශ | ජාතික නිදහස් පෙරමුණ |
| වාසුදේව නානායක්කාර | ප්‍රජාතන්ත්‍රවාදී වාමාංශික පෙරමුණ |
| තිස්ස විතාරණ | ලංකා සමසමාජ පක්ෂය |
| ඒ එල් එම් අතාවුල්ලා | ජාතික කොංග්‍රසය |
| ජී වීරසිංහ | ශ්‍රී ලංකාවේ කොමියුනිස්ට් පක්ෂය |
| ටිරාන් අලස් | එක්සත් මහජන පක්ෂය |
| අසංක නවරත්න | ශ්‍රී ලංකා මහජන පක්ෂය |